**ශීර්ෂය 198 - වාරිමාර්ග අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වාරිමාර්ග අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය සටහන් කිරීමේදී යන්ත්‍රෝපකරණ හා උපකරණ ශේෂය රු.1,544,530 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වාර්තාව සැකසීමේදී අදාල ගිණුම් වර්ෂය ලෙස CIGAS පද්ධතියට පසුගිය වර්ෂයේ දිනයක් යෙදවීම නිසා එය ආරම්භක ශේෂයට සෘජුවම එකතු වීම සිදු වන අතර ඒ අනුව රු.1,544,530 ක වටිනාකමෙන් යුතු යන්ත්‍රෝපකරණ හා උපකරණවල 2021 ආරම්භක ශේෂයට එකතු වී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධව ලබාදී ඇති උපදෙස් අනුව මූල්‍ය වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් 2021 වර්ෂය තුල රු.31,037,018,021 ක් වැයකර සංවර්ධනය කරන ලද දේපල නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ඒ අතරින් රු.19,370,038,036 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් ආයතන 03 ක් වෙත ප්‍රතිපාදන නිදහස් කර අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. එකී වත්කම් එම ආයතන වෙත පවරාගෙන ගිණුම් ගත කිරීම සම්බන්ධ උපදෙස් ද නිකුත් කර නොතිබුණි. | වැය විෂය 2105 - වාරිමාර්ග කළමනාකරණ අංශය වෙත අය වැය ඇස්තමේන්තු මඟින් වෙන් කර ඇති මෙම වැය විෂය යොදා ගන්නේ වාරිමාර්ග ඉඩම් ඒකකවල ඵලදායිතාවය උපරිම කිරීම හා ගොවීන් සවිබල ගැන්වීමට අදාල ක්ෂේත්‍ර මට්ටමින් කරනු ලබන කාර්යයන්වලට අදාල වියදම වේ. මෙම වියදම් මූල්‍ය නොවන වත්කම්වලට අදාල වියදම් ස්වරූපය නොවන බැවින්, වත්කම් ලෙස ගිණුම්ගත කර නොමැති බැවින් මෙම වෙනස ඇති වේ. | මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී සන්සන්දනාත්මකව පරික්ෂා කර නිවැරදි තොරතුරු ඇතුලත් වන බවට තහවුරු කර ගැනිමට කටයුතු කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් **23** ක් සඳහා වෙන් කර තිබූ එකතුව රු. **132,147,800** ක් වූ ශුද්ධ වෙන් කිරීම්වලින් එකතුව රු. **83,609,978** ක් හෙවත් සියයට **63** ක් ඉතිරි වී තිබුණි. එක් එක් වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට **41**ත් සියයට **100** ත් අතර පරාසයක් ගෙන තිබුණි. | වියදම් අවම කර ගැනීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා අත්‍යාවශ්‍යම කාර්යයන් පමණක් සිදු කිරීම, රටේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සැලසුම් කල පරිදි වැය විෂයන්ගේ වියදම් සිදු නොවීම. | අයවැය සකස් කිරීමේදී හැකිතාක් දුරට විචලතා අවම වන පරිදි සිදු කල යුතුය |
| (ආ) | මුලධන වැය විෂයන් 3 කට වෙන්කර තිබූ ප්‍රතිපාදන එකතුව රු.4,911,880,000 ක් වූ අතර ඉන් වැයකර තිබුණේ රු.3,567,724,627 ක් පමණි. ඒ අනුව රු.1,344,155,373 ක ඉතිරියක් නිරීක්ෂණය විය. ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 27 ක් විය. | රටේ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් සහ රටේ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි ව්‍යාපෘති කටයුතු සිදු නොවීම හා ගෙවීම් කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි අක් මුදල් මහා භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතුවිය. | වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදනය උපරිම හා ඵලදායිව ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කල යුතුය. |
| (ඇ) | පරිපූරක ප්‍රතිපාදන යටතේ බල අංක 136, 375 හා 820 යටතේ කෘෂිකර්ම ප්‍රදේශවල කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා අවස්ථා 3 කදී එකතුව රු.760,500,000 ක් ද, බල අංක 905 යටතේ ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කලමනාකරණ ව්‍යාපෘතිය සඳහා පරිපූරක ප්‍රතිපාදන යටතේ රු.651,380,000 ක් ද, සහ බල අංක 1090 යටතේ 2021 දෙසැම්බර් 31 දින පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය යටතේ රු.3,500,000,000 ක් ද ලබා දී තිබුණි. එහෙත් එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.392,485,503 ක්, රු.347,351,813 ක් හා රු.604,318,057 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම්වල ප්‍රතිශතය පිළිවෙලින් | -එම- | -එම- |

සියයට 52 ත්, 53 ක් හා 17 ක් විය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග සැළසුම් කර නොතිබීම නිසා එම ප්‍රතිපාදනයන් ඉතිරි වී ඇති බවද නිරීක්ෂණය විය.

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ගිනුම් චක්‍රලේඛ අංක 255/ 2017 හි ඡේද අංක 02 ( d) ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊලග වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවටත්, උපදෙස්වලට පටහැනිව ඇතිකර ගන්නා වගකීම් නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාරය තවදුරටත් කටයුතු කරනු නොලබන බවටත් උපදෙස් දී තිබියදී 2021 දෙසැම්බර් 31 දිනට රු.2,105,384,895 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි. | වර්ෂය තුල ඉල්ලීම් කරන ලද අග්‍රිම ප්‍රමාණය නොලැබීම හේතුවෙන් බැරකම් ලෙස ඉදිරියට ගෙන යන ලදි. | රාජ්‍ය ගිනුම් චක්‍රලේඛ අංක 255/ 2017 හි ඡේද අංක 02 ( d) ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ හඳුනානොගත් රු 434,066 ක ණය ශේෂ 2022 මැයි වන විටත් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ශේෂය නිවැරදි කරගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ණය ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සේවය හැර ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් එකතුව රු.661,642 ක ණය මුදලක් අය විය යුතුව තිබුණු අතර ඉන් ඒක් නිලධාරියකුගෙන් අය විය යුතු රු.73,062 ක් වු ණය මුදල වර්ෂ 05 කට ත් වඩා පැරණි විය. එම ණය මුදල ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් ආපසු අය කර ගත යුතු වුවත් අමාත්‍යාංශය ඒ පරිදි කටයුතු කර නොතිබුණි. තවද ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර ණය අය කර ගැනීමට කටයුතු නොකිරිම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතුය. |

**2.4 තැන්පත් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙලිඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ සහ රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී ආරම්භ කර ඉදිකිරීම් කටයුතු භෞතික ප්‍රගතිය සියයට 85 ක් ලගාකර ගැනීමෙන් පසු අතරමඟ නතර කර තිබුණි. කොන්තාත් සමාගම වෙත ගෙවන ලද මුදලෙන් රඳවා ගත් මුදල වූ රු. 1,251,774 ක් වර්ෂ 5 ක් ගත වී තිබුණද එය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි වැඩ කොටස් සිදු කිරීමේදී අදාල ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා, එතෙක් කොන්ත්‍රාත්කරුට සිදු කරන ලද සියළු ගෙවීම්වලට අදාල රැදවුම් මුදල් වල එකතුව වන රු. 1,251,774 ක මුදල රජයට අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බැවින් මෙම රැදවුම් මුදල් කොන්ත්‍රාත්කරුට නොගෙවන ලදි. | වගකීම් පැහැර හැරි කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ගිවිසුම් නීතිය යටතේ කටයුතු කර අසාධු ලේඛණ ගත කළ යුතුය. සැළසුම්කළ අපේක්ෂිත අරමුණු කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12 වගන්තිය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 115 වගන්තිය | කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ (111/11) පන්තියේ ගණකාධිකාරී තනතුරක් අනුමත කර තිබියදී ඉහත වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව ඊට ඉහල පළමු පන්තියේ | අදාල නිලධාරියා මෙම ආයතනයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමේ රාජකාරී භාර ගන්නා මුල් අවස්ථාවේදී ඔහු III පන්තියේ ගණකාධිකාරී තනතුරක් හිමි අයෙකු විය. පසුව ඔහු I පන්තියට උසස් කරන ලදි. වෙනත් ගණකාධිකාරීවරයෙකු ඉල්ලා සිටියද | ආයතන සංග්‍රහයට පටහැනිව සිදුකර ඇති පත්වීම සම්බන්ධයෙන් අදාල නීතරීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| තනතුරක් දරන නිලධාරියෙකු වැඩබැලීම සඳහා පත්කර රු.1,280,150 ක දීමනා ගෙවා තිබුණි. | නොලැබීම මත සේවය ලබා ගන්නා ලදි. | |

## 2.6 බැංකු ගිණුම් මෙහෙය වීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය මහා භාණ්ඩාගාරය වෙතට ප්‍රේෂණය කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති බැංකු ගිණුම් 5ක එකතුව රු.316,156,487 ක් වූ මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමකින් තොරව රඳවාගෙන තිබුණි. | මෙම ගිණුම්වල ඉතිරි වී ඇති ශේෂයන් විදේශ ණය ආධාර යටතේ (මූල්‍යකරණය - 12)අදාල ව්‍යාපෘති සඳහා ලැබී ඇති ණය ආධාර ආයතනවල අත්තිකාරම් මුදල් බැවින් , වර්ෂ අවසානයේ මහා භාණ්ඩාගාරය වෙත පියවා නොමැත. | මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූලව වර්ෂ අවසානයේදී ගිණුම් පියවීම් කටයුතු සිදු කිරීමට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමෙ | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 153,915.7 ක් වූ තල්පිටිගල ජලාශය, ඵලදායීතා ප්‍රවර්ධනය සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය, ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය හා උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය සහ සංවර්ධන ව්‍යාපෘති 4 ක් සැලසුම් කළ කාලයමෙන් දෙගුණයකටත් වැඩි කාලයක් ගත වී තිබුණද නිම කර නොතිබුණි. එම ව්‍යාපෘති අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී | **(i)** <u>තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය</u> 2015 සිදු වූ දේශපාලන වෙනස්වීම් සහ උමාඔය ව්‍යාපෘතිය මත ඇති වූ ජනතා විරෝධය මත ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වීය. 2017 දෙසැම්බර් නැවත වැඩ ආරම්භ කිරීමට විදේශ ණය ගිවිසුම චීනයේ EXIM බැංකුව සමඟ අත්සන් කරන ලදි. 2018 ජූනි මස ව්‍යාපෘති කළමණාකරණ ඒකකය (PMU) ස්ථාපිත කළ ද , 2019 පාස්කු ප්‍රහාරය නිසා කොන්ත්‍රාත් සමාගම අධ්‍යනයන් අතරමඟ නවතා ක්ෂේත්‍රයෙන් ඉවත් වුණි. | ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ සඳහා වන බලපෑම තකසේරු කර ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කල යුතුය. කාර්ය මණ්ඩලය සඳහා සේවාදිගු ලබාදීමේදී ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අහිමිවීමේ බලපෑම පිළිබඳ සලකා බැලිය යුතුය . කාලය දීර්ග කිරීමේ අනුමැතිය ලබා ගෙන සළසුම්කළ කාලය තුළ නිම |

| | | |
|---|---|---|
| මූලික අරමුණු යටතේ හඳුනාගෙන තිබූ ආර්ථික වාසි සැළසුම්ගත පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ පිළිබඳ විශ්ලේෂණය කර වගකිව යුතු පාර්ශව පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව එම ව්‍යාපෘති 4 සඳහා වර්ෂ 14 ක කාල සීමාවක් තුළ දරා ඇති රු. මිලියන 90,294.5 ක පිරිවැයෙන් මේ දක්වා ජාතික ආර්ථිකයට කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි. | 2020 දී ශ්‍රී ලංකා ජන රජයේ මුල්‍ය ප්‍රතිපාදන මත නැවත මැනුම්, අධ්‍යනයන් මෙන්ම යටිතල පහසුකම් දියුණු කිරීම PMU මඟින් ආරම්භ කරන ලදි. ඊට සමගාමීව ඉඩම් අත්පත් කර ගැනීම් සහ පරිසර සංවර්ධන කටයුතු ද ආරම්භ කරන ලදි. 2020 සහ 2021 වර්ෂ වල දී ඉඩම් අත්පත් කර ගැනීම් සියයට 95 ක් ද, මැනුම් හා සමීක්ෂණ සියයට 100 ක් ද සහ ප්‍රධාන ඇස්තමේන්තුවෙන් සියයට 4 කට වැඩි වූ යටිතල පහසුකම් දියුණු කිරීම් ද වශයෙන් ව්‍යාපෘතියේ මූලික කටයුතු සියල්ල අවසන් කර ඉදිකිරීම් ඇස්තමේන්තුවෙන් සියයට 9 ක ආසන්න ප්‍රමාණාත්මක වැඩ කොටසක් නිම කර ඇත. තවද මූලස්ථායී වැඩ කඩිනමින් ආරම්භ කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.<br><br>(ii) ඵලදායිතා ප්‍රවර්ධන සහ වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය කළමණාකරනය කිරීමේ ව්‍යාපෘතිය.<br>මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය සහ අත් මුදල් ප්‍රමාණය නොලැබීම නිසා බලාපොරොත්තු වූ ඉලක්ක වලට ළඟා වීමට නොහැකි විය. මේ නිසා සමස්ත භෞතික ප්‍රගතිය සියයට 12.16 කට සීමා වී ඇත. | කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

**(ආ) ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය**

---------------------------------

| | | |
|---|---|---|
| **(i)** ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2014 නොවැම්බර් 05 දින වාරිමාර්ග හා ජල සම්පත් කලමනාකරණ අමාත්‍යාංශය සහ චීනයේ **CAMEC IUD** සමග ඇ.ඩො. 690,000,000 ක **EPC** කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ඒ සඳහා පූර්ව වැඩ අත්තිකාරම් ලෙස කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 4.35 ක් වූ | මෙහිදී 2015.05.28 දිනැතිව අග්‍රාමාත්‍ය ලේකම් විසින් ලබා දුන් උපදෙස් අනුව කැඳවුම් නොලත් ඍජු ව්‍යාපෘති තාවකාලිකව අත්හිටුවීමට උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ ඇපකරය මුදල් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දී ඇත. කෙසේ නමුත් ඉන්පසුව සිදුවූ අමාත්‍යාංශ විෂය පථ වෙනස් වීමෙන් | ගිවිසුමේ කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධ වගකිව යුතු නිලධාරින් පිළිබඳ විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇ.ඩො. 29,989,000 ක් (රු.4,011,054,982) ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල **EPC** ගිවිසුමේ පස්වන වගන්තිය පරිදි එම ගිවිසුම ක්‍රියාත්මක තත්ත්වයට පැමිණිමට නම් එකී වගන්තිය යටතේ ඇති කරුණු සියල්ල සම්පූර්ණ විය යුතු බව හා ගිවිසුම අත්සන් කල දින සිට වර්ෂයක් තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් නොවන අවස්ථාවකදී දෙපාර්ශවයේඑකඟතාවයකින් තොරව ගිවිසුම අවලංගු විය යුතු වේ. ඒ අනුව 2015 නොවැම්බර් 05 දිනට ගිවිසුම අවලංගු බවට පත් ව තිබුණි. | අනතුරුව හා හම්බන්තොට කර්මාන්තපුරය ආශ්‍රිතව සංවර්ධන යෝජනාවලින් ඉදිරියට පැමිණීමත් සමග ව්‍යාපෘතිය අත්හිටුවීමෙන් තොරව ඉදිරියට සිදු කර ගෙන යාමට උපදෙස් හිමි වී ඇති බවට නිරීක්ෂණය කරමි.<br><br>ව්‍යාපෘතියේ පවතින වැදගත් භාවය හා ඒ සඳහා දේශපාලන අධිකාරිය විසින් ලබා දුන් උපදෙස් මත ව්‍යාපෘතියේ කටයුතු ඉදිරියට සිදු කර ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවට නිරීක්ෂණය කරමි. | |
| **(ii)** | අත්තිකාරම් ඇපකරය මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව පිළිබඳ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ තීරණය පරිදි අග්‍රාමාත්‍ය ලේකම් විසින් ලබා දුන් උපදෙස් පරිදි වහාම ව්‍යාපෘතියේ කටයුතු නතර කර නීතිපතිවරයාගෙන් අදහස් ද ලබා ගැනිමකින් තොරව හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් ද තොරව අදාල අත්තිකාරම් මුදල ව්‍යාපාතියේ පළමු අදියර ලෙස නම් කරන ලද මූලික දත්ත රැස් කිරීම, මැනුම් කටයුතු, භූගෝලීය නිරීක්ෂණ කටයුතු ශක්‍යතා අධ්‍යාන වාර්තාව යාවත්කාලීන කිරීම සහ මූලික සැළසුම් සකස් කිරීම යන කටයුතු සඳහා වූ පිරිවැය ලෙස හඳුනාගෙන ඒවා මාස **8** ක් තුළ නිම කිරීම සඳහා **2017** ජනවාරි **20** වන දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් අවබෝධතා ගිවිසුමක් සකස් කර තිබුණි. ඒ යටතේ හඳුනාගත් වැඩ කොටස්වලට අදාල සම්පූර්ණ මුදලම එකවර ගෙවා තිබියදී අවුරුදු **5** ක් ගත වී ඇතත් ව්‍යාපෘතියේ මූලික සැළසුම් සකස් කිරීම මේ දක්වා නිම කර | ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය යනු ප්‍රධාන ගංගා ද්‍රෝණි 05 ක් සෘජුව සම්බන්ධ වන ව්‍යාපෘතියක් වන අතර මීට පෙර ක්‍රියාත්මක වූ මහවැලි මහ සැලැස්මට පමණක් දෙවැනි වන ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතියක් වේ. මෙවැනි ව්‍යාපෘතියක ශක්‍යතා අධ්‍යයනය ඉතා සංකීර්ණ වන අතර මේ සඳහා බලපෑ සමාජ, දේශපාලනික හා පාරිසරික කරුණු හමුවේ වඩාත් සංකීර්ණ විය.<br><br>ඒ අනුව ගිවිසුම්ගත කොන්දේසි අනුව මාස 09 ක් තුලදී ව්‍යාපෘතියේ අදියර I නිම කිරීමට නියමිත වුවද ඉහත සඳහන් කල කොන්ත්‍රාත්කරුගේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පාලනයෙන් පරිබාහිර සාධක හේතුවෙන් එම කටයුතු අවසන් වීම මෙතෙක් ප්‍රමාද වී ඇත. | අමාත්‍ය මණ්ඩල අනුකමිටු තීරණය පරිදි නීතිපති උපදෙස් ලබාගැනීමකින් තොරව කටයුතු කළ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධව විධිමත් පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. භෞතික කාර්ය සාධන වාර්තාව අනුව එකී කටයුතුවලින් **26%** ක් තවදුරටත් නිම කළ යුතුව පැවතුණි. | | |
| **(iii)** | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකගතාවය හා අනුග්‍රහය ලබාගත යුතු බව සඳහන්කර වර්ෂ 4 ක් ගත වි ඇතත් එය ලබාගෙන නොතිබියදි ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යමින් පැවතුණි. තවද ව්‍යාපෘතිය සඳහා බඳවා ගත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් වෙනුවෙන් වර්ෂ 5 ක කාලසීමාවක් තුළ රු.මිලියන. 57 ක් දැරීමට සිදු වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු වර්ෂ 8 ක් අඛණ්ඩව ප්‍රමාද වීම තුළ එය අනාර්ථික හා අතිරේක වැය බරක් බවට පත්ව තිබුණි. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය ලබා ගැනීමට අවස්ථා ගණනාවකදී උත්සහ කල අතර මේ පිලිබදව අමාත්‍ය මණ්ඩල සංදේශ හරහාද කරුණු ඉදිරිපත් කල නමුත් ඒ සෑම අවස්ථාවකදීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් හා සාකච්චා කර සුදුසු තීරණ ගන්නා ලෙසට උපදෙස් ලැබුණි.<br><br>ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලය 15 ක් වුවද කිසිදු අවස්ථාවක එම සම්පූර්ණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදුකර නැත.<br><br>තවද හැකි සෑම අවස්ථාවකදීම අවම කාර්ය මණඩලයක් හරහා ව්‍යාපෘති කටයුතු සිදුකරගෙන ගොස් ඇති අතර එමගින් 2017 සිට මේ දක්වා කාර්ය මණ්ඩල වෙනුවෙන් ගෙවන ලද වැටුප් රු.මි. 27 ක් පමණ සීමා කර ගැනීමට හැකිවී ඇත. | ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් නිදහස් කිරීමට ප්‍රථම පාරසරික ඇගයීම් සහ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කර අදාළ රේඛීය ආයතනයන්හි අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබීම පිළිබඳ හා එමගින් ඇති වී ඇති තත්ත්වයන් පිළිබඳව වගකිවයුතු පාර්ශවයන් සම්බන්ධ විධිමත් ක්‍රියාමාර්ග ගැනීම. |
| **(iv)** | අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/01/ASP/2016/01(VoIII) දරණ 2016.06.23 දිනැති ලිපිය මගින් ආර්ථක කළමනාකරණය පිළිබඳ අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගග ආශ්‍රිතව පමණක් සිදු කිරීමට නිර්දේශ කරන බවත්, ඒ අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් ලබා දී තිබූ නමුත් එකී අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමකින් තොරව 2017.07.20 දින ගිවිසුමට එළඹ තිබුණි. එමගින් ගිං ගග හා නිල්වලා යන කොටස් 2 ම පිළිබඳ අධ්‍යනයන් කිරීමට පවරා තිබුණි. | නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ගිං හා නිල්වලා යන ගංගා ද්‍රෝණිය ද්විත්වයෙහි පවත්නා අතිරික්ත ජලය අග්නි දිග වියලි කලාපය වෙත හරවා යැවීම වන අතර එහිදී වැඩි ජල ප්‍රමාණයක් ගෙන යා හැකි වන්නේ ගිං ගඟ ද්‍රෝණියෙනි. එනම් වාර්ෂිකව හරවා යැවීමට අපේක්ෂිත ඝන මීටර් මිලියන 300 ක ප්‍රමාණයෙන් ඝන මීටර් මිලියන 200 ක් ගිං ගග ද්‍රෝණියෙන් ලබා ගන්නා ජලය වන අතර නිල්වලා ද්‍රෝණියෙන් ලබා ගන්නා ජල ප්‍රමාණය සාපේක්ෂව අඩු අගයක් ගනී. | ආර්ථික කළමනාකරණය පිළිබඳ අනුකමිටුව විසින් මෙම ව්‍යාපෘතිය නිල්වලා ගග ආශ්‍රිතව පමණක් සිදු කිරීමට හා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස කළ නිර්දේශ නොසලකා හැර ඇති පාර්ශව සම්බන්ධයෙන් සොයාබලා විධිමත් පියවර ගතයුතු වීම. |

නිර්දේශ අනුව ආර්ථික කළමනාකරණ අනුකමිටුව මගින් ව්‍යාපෘතිය නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් සිදු කිරීමට කර තිබූ නිර්දේශය නොසලකා එළඹ තිබූ ගිවිසුම මගින් UNESCO සංවිධානය විසින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගිං ගඟ ආශ්‍රිතව හා නිල්වලා ගඟ යන කොටස් 2 ක සඳහාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කාර ආයතනය සමඟ එකඟතාවයකට පැමිණ තිබුණි. එම නිසා මෙම ව්‍යාපෘතියට අදාළ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවල අනුමැතීන් ලබා ගැනීමට නොහැකි වීම සහ මහජන විරෝධතා එල්ල වීම ආදී තත්වයන් නිර්මාණය වී තිබුණි. ඒ බව අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි ද අනාවරණය කර තිබුණි.

ඒ අනුව 2017 වර්ෂයේ අවිධිමත් ලෙස එළඹී අවබෝධතා ගිවිසුම යටතේ සිදු කරනු ලබන අධ්‍යයනයන් හා සැලසුම් ද නිෂ්ප්‍රයෝජන වන බව නිරීක්ෂණය විය.

එබැවින් නිල්වලා ගංගා ද්‍රෝණියේ ජලය පමණක් හරවා යැවීම කිසිසේත් ප්‍රමාණවත් නොවන අතර ඒ සඳහාද සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතු වන බැවින් නිල්වලා ගඟ ආශ්‍රිතව පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාක්ෂණික හා ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවය ඉතා අඩු ව්‍යාපෘතියක් වනු ඇත. එම හේතුව මත ගිං හා නිල්වලා යන ගංගා ද්‍රෝණි ද්විත්වයම ආශ්‍රිතව අධ්‍යයන කටයුතු කිරීම අදාල සමාගමට පැවරීම සිදු කර ඇත. පවත්නා ආර්ථික, සමාජීය හා දේශපාලනික තත්ව මත මෙම අවස්ථාවේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුවද මෙවැනි ව්‍යාපෘතියක අධ්‍යන කටයුතු වෙනුවෙන් දරන්නා වූ වියදම් අනාගතයේදී වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

(ඇ) **උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**

--------------------------------------------

උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සංශෝධිත මුළු පිරිවැය ඇස්තමේන්තුව මුලස්ථායි වැඩ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක් හා සෙසු පිරිවැය හා යටිගං පෙදෙස සංවර්ධනය සඳහා රුපියල් මිලියන 15,474.25 ක් අරමුදල් මූල්‍යනය කිරීමට අපේක්ෂා කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය අවසානය වනවට මුලස්ථායි වැඩ වෙනුවෙන් දේශීය අරමුදල් රුපියල් මිලියන 72,153.17 සහ විදේශීය අරමුදල් රුපියල් මිලියන 6,522.85 ක් ලෙස රුපියල් මිලියන 78,676.02 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2008 වර්ෂයේ ආරම්භ කර වර්ෂ 07 කින් එනම් 2015 නොවැම්බර් 15 දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද , 2021 දෙසැම්බර් 25 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමේ | නිර්දේශය |
| --- | --- | --- |
| (i) ව්‍යාපෘතිය සඳහා අරමුදල් ඉරාන අපනයන සංවර්ධන බැංකුව මඟින් මුල්‍යානය කිරීමට යටත්ව තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොන්ත්‍රාත්කරු තෝරාගෙන 2007 නොවැම්බර් 27 දින ගිවිසුමකට එළඹී තිබුණි. එහෙත් 2013 වර්ෂයේදී ඉරානය වෙත පනවන ලද ආර්ථික සම්බාධක හේතුවෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද විදේශීය ණය මුදල අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ පිරිවැය ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් මුල්‍යකරණය කර තිබුණි. එම තත්වයන් අනුව දේශීය අරමුදල් මඟින් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම පිළිබඳ තීරණය කිරීමේදී ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් කැඳවීම තුලින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරගකාරී වාසි පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. | ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) විසින් ව්‍යාපෘතිය සඳහා විදේශීය ණය මුදල් ලබා දීමට එකඟ වී තිබූ නමුත් 2013 වර්ෂයේදී ඉරාන රජයට සම්බාධක පැනවූ නිසා ඉරානය හා ශ්‍රී ලංකාව අතර බැංකු ගණුදෙනු නවතා දැමීමට සිදු වූ අතර ,ඊට සමගාමීව ඉරාන අපනයන සංවර්ධන බැංකුවේ මූල්‍ය පහසුකම් ද නතර විය. ඒ වන විට ලංකා රජයෙන් කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද අත්තිකාරම් මුදල වන ඇ.ඩො.77,107,880 කට අමතරව කොන්ත්‍රාත්කරු විසින් කරන ලද වැඩ සඳහා ඉරාන අපනයන සංවර්ධන බැංකුව හරහා ඇ.ඩො . 50,619.304 ක මුදලක් ගෙවා තිබුණි. පුහුල්පොළ ජලාශයේ ඉදිකිරීම් කටයුතු හැරුණුකොට අනෙකුත් සියළුම ඉදිකිරීම් ආරම්භ කර තිබුණි .ඊට අමතරව උමං කැණීම් යන්ත්‍ර දෙක හා ඉදිකිරීම් සඳහා අවශ්‍ය අනෙකුත් යන්ත්‍ර සූත්‍ර හා වාහනද ගෙන්වා තිබුණි. කොන්ත්‍රාත්කරු දැනුවත් කර ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන මත ව්‍යාපෘතිය කරගෙන යන ලදි.<br><br>EDBI මගින් ලැබිය යුතු මූල්‍ය පහසුකම් නොලැබී ගිය අවස්ථාවේදී ව්‍යාපෘතිය එම කොන්ත්‍රාත් සමාගමෙන් අවසන් කර නැවත ජාත්‍යන්තර තරඟකාරී මිළ ගණන් කැඳවීමකට යාම තුළින් සේවා යෝජකයාට ප්‍රතිලාභ ලැබීම තවදුරටත් ප්‍රමාද වන අතර එවැනි තීරණයක් ගතහොත් විශාල අමතර පිරිවැයක් දැරීමට සිදුවනු ඇත .තව ද එවැනි තීරණයක් ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රායෝගික ගැටළු රැසකට සේවා යෝජයාට මුහුණ දීමට සිදු වනු ඇත. | ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් කැඳවීම තුලින් ශ්‍රී ලංකා රජයට ලබාගත හැකිව තිබූ තරගකාරී වාසි පිළිබඳ තක්සේරු කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂා කර තිබූ ප්‍රතිලාභයක් වූ විදුලි බලය ජනන පද්ධතියට අමතරව මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය හා තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටි නව ඉඩම් හෙක්ටයාර 4,500 ක් හා දැනට වගා කෙරෙන ඉඩම් හෙක්ටයාර 1,500 ක් සඳහා වාරි ජලය සැපයීම , ව්‍යාපෘති ප්‍රදේශයේ පානීය හා කර්මාන්ත සඳහා වාර්ෂිකව ඝන මීටර් මිලියන 30 ක ජලය සැපයීම සහ ඩයබරා හා පුහුල්පොල ඉදි කෙරෙන ජලාශ මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල සහ ඇටැම්පිටිය ප්‍රදේශවල පානිය ජල අවශ්‍යතා සැපයීම යන ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | පහල නිම්න සංවර්ධන කටයුතු යටතේ , අලිකොටආර ජලාශය ඉදිකිරීමේ සිට කුඩා වැවු 100 ක් පුනරුත්ථාපනය කිරීම දක්වා සංරචක 6 ක් ඇතුලත වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජලය බෙදා හැරීම සඳහා ඉදිකෙරෙමින් පවතින ජලාශ , ඇළවේලි සහ වැව් පුනරුත්ථාපනය කිරීම තවදුරටත් සිදුවෙමින් පවතියි. 2022 දෙසැම්බර් මස අවසන් වීමට පෙර සියළු වැඩ කටයුතු අවසන් කර , ප්‍රධාන වාරිමාර්ග ජලාශයට, ඩයරබා හා පුහුල්පොළ ජලාශ 2 න් නිකුත් කරන ජලය ලබා දීමට සැලසුම් කර ඇත. එමෙන්ම ඇටම්පිටිය ජල යෝජනා ක්‍රමය මඟින් පුහුල් පොළ ජලාශයේ ජලය, ඇත්තලපිටිය, අමුණුදෝව, කුරුකුදේගම හා වරකාදණ්ඩ යන ප්‍රදේශවලට 2019 වර්ෂයේ සිට සපයනු ලැබේ. බණ්ඩාරවෙල දියතලාව හා හපුතලේ සංකලිත ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර , මේ සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා ඩයබරා ජලාශය ජල මූලාශ්‍ර ලෙස භාවිතා කරන අතර , ඒ සඳහා ව්‍යුහය ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. ජලාශය පිරවීමට (දෙසැම්බර් 31 ට) පෙර සියළු ඉදිකිරීම් කටයුතු නිම කිරීමට ජාතික ජල සම්පදන හා ජල ප්‍රවාහන මණ්ඩලය කටයුතු කරමින් සිටියි. | ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ සඳහා වන බලපෑම තකසේරු කර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කල යුතුය. |
| **(iii)** | මේ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී EPC කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රතිපාදන අනුව අය කරන ලද ප්‍රමාද ගාස්තු ආපසු ගෙවීම තුලින් කාලය දීර්ඝ කිරීම අනුමත කල කාලසීමවට අදාල කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමට ඇතිවන බැදීමේ බලපෑම පිළිබඳ අදාල අමාත්‍යංශ දැනුවත් කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන උමගෙහි ඇති වූ ජල කාන්දුව හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු වන්දි වෙනුවෙන් 2021 අගෝස්තු 31 වන විට රජයේ මුදලින් රු.1,931,346,396 ගෙවා තිබුණි. | 2019 අප්‍රේල් වන තෙක් වන්දි වශයෙන් ගෙවූ මුදලින් ෆරාබ් සමාගමෙන් අයකර ගැනීමට ඉතිරි වූ මුදල වන රුපියල් 584,813,829.83 මුදල සමාන වාරික 06 කින් ෆරාබ් සමාගමට ගෙවන බිල්පත් වලින් අයකර ගැනීමට නිර්දේශ කර ඇත. ඒ අනුව ෆරාබ් සමාගම ඉදිරිපත් කළ 95 වන බිල්පතෙන් පළවන වාරිකය වන රුපියල් 96,196,400 ක මුදලක් අය කරගෙන ඇත. | වන්දි වෙනුවෙන් ගෙවා ඇති මුදල් ඊට අදාළ පොලී මුදල් ද සමග කොන්ත්‍රාත් කරුගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (v) | 2015 නොවැම්බර් 15 දින සිට 2021 දෙසැම්බර් 25 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම් සිදු කර තිබුණ අතර EPC කොන්ත්‍රාත් ගිවිසුමේ 8.7 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව දිනකට කොන්ත්‍රාත් වටිනාකමින් 0.01% වශයෙන් උපරිමය 5% ක් දක්වා, අයකල හැකිව තිබූ ප්‍රමාද ගාස්තුව ඇමරිකානු ඩොලර් මිලියන 26.453 ක් අය කර නොතිබුණි. | විගණන වාර්තාවේ දැක්වෙන පරිදි ප්‍රමාද ගාස්තුව ලෙස ඇමෙරිකානු ඩොලර් 6,631,364 ක් අයකර තිබුණි. ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් ෆරාබ් සමාගම දැනුවත් කිරීමෙන් අනතුරුව ෆරාබ් සමාගමේ 33 වන බිල්පතේ සිට ප්‍රමාද ගාස්තු අයකර ගැනීම ආරම්භ කර ඇත.<br><br>ඉන්පසු ප්‍රමාද ගාස්තු අයකර ගැනීම තවදුරටත් තීරණය කරන තුරු තාවකාලිකව නතර කිරීමට එවකට සිටි ජනාධිපති තුමා නියෝගයක් නිකුත් කර තිබූ බැවින්, ෆරාබ් සමාගමේ 40 වන බිල්පතෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමෙන් පසුව ප්‍රමාද ගාස්තු අයකර ගැනීම නතර කර ඇත. ඒ වන විට ප්‍රමාද ගාස්තු වශයෙන් අය කර ගත් මුළු මුදල ඇමෙරිකානු ඩොලර් 6,631,364 ක් විය. | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කල යුතු අතර අයකරන ලද ප්‍රමාද ගාස්තු නැවත ගෙවීම සම්බන්ධයෙන්, අදාල පර්ශව දැනුවත්කර නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. |
| (vi) | කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද ඇමරිකානු ඩොලර් 6,631,364 ක් මුදලින් අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ඉන් ඇමරිකානු ඩොලර් 5,305,091 ක් ආපසු ගෙවීම් කර තිබුණි. | අයකර ගත් ප්‍රමාද ගාස්තු නැවත ෆරාබ් සමාගම වෙත ගෙවීමට ඇති හැකියාව සොයාබැලීම සඳහා පත්කරන ලද<br>කමිටු වාර්තාවට අනුව අයකරගත් ප්‍රමාද ගාස්තු වලින් 80% ක් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබූ සෑම අවස්ථාවකදීම නැවත ප්‍රමාද ගාස්තු අයකරගැනීම ආරම්භ කිරීම සඳහා සහ ෆරාබ් සමාගම වෙත නැවත ගෙවූ ප්‍රමාද ගාස්තු ආපසු අයකර ගැනීමට නිර්දේශ කරන ලදි. | |
| (vii) | වන්දි වශයෙන් ශ්‍රී ලංකා රජයෙන් ගෙවන ලද රු.889,789,252 ක් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබූ අතර කොන්ත්‍රාත්තුවට අදාල රක්ෂණ සමාගමෙන් අයකරන ලද ඇමරිකානු ඩොලර් 8,155,981 න් වන්දි ලෙස ලබාගෙන තිබුණි. | 2019 අප්‍රේල් වන තෙක් වන්දි වශයෙන් ගෙවූ මුදලින් ෆරාබ් සමාගමෙන් අයකර ගැනීමට ඉතිරි වූ මුදල වන රුපියල් 584,813,829 මුදල සමාන වාරික 06 කින් ෆරාබ් සමාගමට ගෙවන බිල්පත් වලින් අයකර ගැනීමට නිර්දේශ කර ඇත.<br><br>ඒ අනුව ෆරාබ් සමාගම ඉදිරිපත් කළ 95 වන බිල්පතෙන් පළවන වාරිකය වන රුපියල් 96,196,400 ක මුදලක් අය කරගෙන ඇත. | වන්දි වශයෙන් ශ්‍රී ලංකා රජය ගෙවන ලද මුදල අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (viii) | කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කල කාල සීමාව වෙනුවෙන් අතිරේක වියදම් හා බිල්පත් සඳහා ගෙවීම් ප්‍රමාද වීම වෙනුවෙන් ඇමරිකානු ඩොලර් 181,337,171 ක අමතර ගාස්තුවක් ඉල්ලා තිබුණි. EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එම ඉල්ලීම විධිමත් ලෙස ප්‍රතික්ෂේප කර ඒ පිළිබද ප්‍රතිපත්ති සම්පාදන අංශ දැනුවත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කර නොතිබුණි. ව්‍යාපෘතිය තුලින් අපේක්ෂා කල ප්‍රතිලාභ 2022 මැයි වන විටත් ලබාගත නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එම ඉල්ලීම විධිමත් ලෙස ප්‍රතික්ෂේප කර ඇති අතර ෆරාබ් සමාගම ප්‍රමාද ගාස්තු හිමිකම් ඉල්ලා එවූ සෑම අවස්ථාවකදීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ඒවා අධ්‍යයනය කර, සේවා යෝජකයා විසින් බිල්පත් ගෙවීම ප්‍රමාද වීම නිසා ෆරාබ් සමාගමට ප්‍රමාද ගාස්තු හිමිකම් ගෙවීම හැර, ඔවුන් ඉල්ලා ඇති අනෙකුත් කාරණා සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට නොහැකි බව ලිඛිතව දන්වා ඇත.<br><br>ඒ අනුව ප්‍රමාද ගාස්තු හිමිකම් වශයෙන් ෆරාබ් සමගම ඉදිරිපත් කල එක්සත් ජනපද ඩොලර් 181,337,171ක හිමිකම් ගාස්තු පිළිබද අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීමට සාකච්ඡ සම්මුති කමිටුවක් (CANC)කැබිනට් අනුමැතිය අනුව පත් කළ අතර එම කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගෙන එක්සත් ජනපද ඩොලර් | EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එම ඉල්ලීම විධිමත් ලෙස ප්‍රතික්ෂේප කර ඒ පිළිබද අමාත්‍ය මණ්ඩලය දැනුවත් කල යුතුය. අදාල ප්‍රමාද මුදල් ගෙවීමට ප්‍රථම කාලය දීර්ග කිරීමෙන් ඇතිවන බලපෑම අතුළු වෙනත් හිමිකම්පෑම් සිදු නොකරන බවට කොන්ත්‍රාත්කරුගේ එකගතාවය ලබාගත යුතුය. |

38,612,000ක මුදල පමණක් හිමිකම් ගාස්තු වශයෙන් ගෙවීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී තිබේ.

**(ඇ) භූගත ජල විමංසන තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම**

**-----------------------------------------------------------**

වකුගඩු රෝගය විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇති අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයක නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය යුරෝ 20,629,921.18 හෙවත් රුපියල් මිලියන 3,628.39 ක් යටතේ විදේශීය සමාගමක් සමඟ ඉංජිනේරු, ප්‍රසම්පාදන සහ ඉදි කිරීම් (EPC) කොන්ත්‍රාත්තුවක් ලෙස ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ඔක්තෝම්බර් 03 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පසත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි.

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීමෙ<br>------------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- |
| (i) මෙම ව්‍යාපෘතිය යටතේ දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යූරෝ 1,473,462 ක් වෙන් කර තිබුණද වර්ෂ 04 ක් ගතවී ඇතත් ඉදිකිරිම් කටයුතු 2022 අගෝස්තු වන විටත් ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘතිය සඳහා ලබා දි තිබූ මාස 18 ක දින දීර්ඝ කිරීම 2022 සැප්තැම්බර් මස 30 දිනෙන් අවසන් වීමට නියමිතව පවතින බැවින් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට සමගාමීව දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිනොකිරීම තුළ ව්‍යාපෘතියේ මූලික අරමුණු හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වී තිබුණි. | දත්ත මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අමතරව ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටුවීම සඳහා ද මෙම ගොඩනැගිල්ල ව. අඩි 24,000 ප්‍රමාණයට සැලසුම් කරන ලද අතර එයින් ව. අඩි 18,000 ක ඉදිකිරීම් කටයුතු ප්‍රථම අදියර යටතේ අවසන් කිරීමට තීරණය කළ බැවින් අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වීම හේතුවෙන් අසම්භාව්‍ය වෙන් කිරීම (Provisional sum) යටතේ යූරෝ 439,539 ක් වෙන් කරන ලදි. සැලසුම් සියල්ල මේ වන විට නාගරික සංවර්ධන අධිකාරය වෙත ඉදිරිපත්කර ඇතත් සින්නක්කර ගිවිසුම පවා මේ වන තුරුත් ලබා දී නොමැත, කෙසේ නමුත් මේ වන විටත් දත්ත මධ්‍යස්ථානයක් රත්මලාන ව්‍යාපෘති කාර්යාලයෙහි ස්ථාපිත කර ඇති බැවින් ව්‍යපෘතියෙහි අරමුණුවලට කිසිදු අහිතකර බලපෑමක් සිදු වී නොමැති බව කාරුණිකව දන්වා සිටිමී. | දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීමේ අවශ්‍ය කටයුතු සිදු කල යුතු අතර සැලසුම් කල පරිදි කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරින් සම්බන්ධව ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | ගිවිසුම් ප්‍රකාරව වසර 03 ක කාල සීමාවන් තුල නිම කිරිමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මෙය EPC/ Turnkey කොන්ත්‍රාත්තුවක් බවත් කොන්ත්‍රාත්කරුට මෙම කාලය දීර්ඝ කිරීමට අදාළ කිසිදු අතිරේක පිරිවැයක් සඳහා ඉඩ නොදෙන බව සඳහන් කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කිරීම සඳහා 2021 මාර්තු 11 දිනැතිව ඉදිරිපත් කර තිබූ ලිපිය අනුව එසේ අතිරේක පිරිවැයක් අය නොකරන බව සඳහන් කර නොතිබුණි. ගිවිසුමේ 3.1.1 වගන්තිය අනුව (PCC 3.1.1) එවැනි එකඟතාවයක් ලබා ගැනීම ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ රාජකාරියක් බව සඳහන්ව ඇත. ඒ අනුව අනාගතයේදී කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම් ප්‍රකාරව කාලය දීර්ඝ කළ කාල සීමාව වෙනුවෙන් වූ අතිරේක බිල්පත් ඉදිරිපත් කර බේරුම්කරන මණ්ඩලය වෙත යොමු වුවහොත් ශ්‍රී ලංකා රජයට අවාසියක් සිදු වීමේ අවදානම පැවතුණි. ඒ අනුව රජයේ අයිතිවාසිකම් ආරක්ෂාවන පරිදි ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම සඳහා කටයුතු කර ඇත්තේ 2021.03.28 දින වන අතර ගිවිසුමේ කොන්දේසි අනුව කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් යම් අතිරේක බිල්පතක් ඉදිරිපත් කරන්නේ නම් එදින සිට දින 28ක කාලයක් ඇතුලත සිදු කළ යුතු වේ .මේ දක්වා එවැනි ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැත.<br>තවද, මේ වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් අදියරට පැමිණ ඇති බැවින් අතිරේක බිල්පත් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී. | කාලය දිර්ග කිරිමේදි ඒ සඳහා වූ කොන්දෙසි ඇතුලත් වන පරිදි එකගතාවයට එළඹිමට අවශ්‍ය කටයුතු සිදුකර ඉන් පැන නැගිය හැකි අනාගත අවාසි මගහරවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඵලදායීතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය රු.මිලියන 18,500 ක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණි. ඒ සඳහා 2017 සිට 2021 දක්වා රු.මිලියන 2,528 ක් වෙන්කර තිබුණු අතර රු.මිලියන 1,595 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ව්‍යාපෘතිය සඳහා සංවර්ධන පාර්ශවකරුවන් වෙතින් අරමුදල් ලබා ගැනීමේ හැකියාව පිළිබද පරීක්ෂා කර බලන ලෙස උපදෙස් ලබා දී තිබුණද ඒ පිළිබදව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව නිසි සම්බන්ධීකරණයක් සිදු කර නොතිබුණි. දේශීය අරමුදල් වලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් සංවර්ධන පාර්ශ්වකරුවන් වෙතින් අරමුදල් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා වාර ගණනක් පවත්වා ඇති අතර ඵලදායිතා ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය පුනරුත්තාපන හා ප්‍රජා මූලික වැඩසටහනක් වන බැවින්, මේ සඳහා දේශීය අරමුදල් යෙදවීම සුදුසු බවට යෝජනා වීම මත ඒ අනුවකටයුතු කර ඇත. | උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳව පරික්ෂා කළ යුතුය. |
| (ආ) ව්‍යාපෘතියේ කටයුතු 2017 සිට 2021 කාල සීමාව තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණද භෞතික ප්‍රගතිය සියයට 12 ක් විය. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 8.6 ක් විය. | ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු, ඇස්තමේන්තු සකස් කිරීම යන කටයුතු භෞතික ප්‍රගතියේ කොටසක් වන අතර ඒ සියල්ල මූල්‍ය ප්‍රගතියෙන් විද්‍යාමාන නොවන නිසා මූල්‍ය ප්‍රගතියට වඩා භෞතික ප්‍රගතිය වැඩි අගයක් ගෙන ඇත. | සැලසුම් කල පරිදි කාර්ය නිමකිරිමේදි අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

**3.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යසාධන වාර්තාවේ 1.4 යටතේ දැක්වූ සංවර්ධන සටහන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | 1.6 ඡේදය යටතේ මහවැලි අධිකාරිය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස හෙළිදරව් කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | - එම - |
| (ඇ) | මහවැලි අධිකාරිය යටතේ සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබූ සිමාසහිත මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම. 2020 දෙසැම්බර් 30 දින සිට අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණි. ඊට අදාල කිසිදු තොරතුරක් කාර්ය සාධන වාර්තාව මගින් අනාවරණය කර නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නැත. | - එම - |

**3.4 කළමනාකරණ දූර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 භාණ්ඩ සමීක්ෂණයේදි ඌනතාවයන් ලෙස හඳුනාගෙන තිබූ රූපවාහිනි යන්ත්‍රය සහ ශීතකරණය, අග්‍රාමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ලබා දී ඇති නිල නිවසේ පවතින බවටත් ටැබ් පරිගණක යන්ත්‍රය හිටපු | මෙම භාණ්ඩ ඌනතාවයට වගකිව යුතු නිලධාරිණියගේ වැටුපෙන් අය කර එවන ලෙස එම නිලධාරිණිය දැනට සේවය කරනු ලබන ඌව පලාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | භාණ්ඩ සමීක්ෂණයේදි ඌනතාවයන් ලෙස හඳුනාගෙන තිබූ භාණ්ඩ නිරවුල් කර ගැනීමට කටයුතු සිදු කල යුතුය. . |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් භාරයේ පවතින බවටත් හදුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වෙත 2022.04.28 දින දන්වා යවා ඇත. රූපවාහිනී යන්ත්‍රය හා ශීතකරණය දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය භාරයේ ඇති අතර එය නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. ටැබ් පරිඝණක යන්ත්‍රය භාර දීමට කටයුතු කරන බව දන්වා ඇත. එසේ භාර දීම තවදුරටත් ප්‍රමාද වන්නේ නම් එහි වටිනාකම ද අය කර ගැනීමට කටයුතු කරමි. | |
| (ආ) | කොත්මලේ වාරි හා ජල සම්පත් කළමනාකරණය පිලිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය<br>------------------------------------------------ | | |
| | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා විසින් 2017 ජුලි 04 දින ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා පහසුකම් සැලසෙන පරිදි විදේශ මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමටත් , ප්‍රතිලාභ හා යෝජනා පදනම් කරගෙන විදේශ පුහුණු පාඨමාලාවන් පැවැත්වීමටත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද, 2022 වන විටත් එසේ සිදු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් ප්‍රතිලාභ හා යෝජනා පදනම් කරගනිමින් විදේශ පුහුණු පාඨමාලා පැවැත්විමට කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල අනුමතිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2012 වර්ෂයේ ආරම්භ කල කොත්මලේ වාරිමාර්ග අභ්‍යාස ආයතනය විසින් 2012 වර්ෂයේ සිට 2020 දක්වා බඳවාගෙන පුහුණුවීම් අවසන් කර තිබූ සංඛ්‍යාව 172 ක් වූ අතර 2020, 2021 වර්ෂවල බඳවාගෙන දැනට පුහුණු වීම් ලබන සංඛ්‍යාව 61ක් විය. ඒ අනුව ආයතනය වෙත ලබා දී ඇති සම්පත්වලට අමතරව ආයතනයේ වාර්ෂික මුළු වියදමේ සමස්තය රු. මිලියන 36.5 ක් විය. වර්ෂ 9 ක් තුළ පුහුණු වූ සහ පුහුණු වෙමින් සිටි සිසුන් සංඛ්‍යාවේ සාමාන්‍යය සිසුන් 20 ක් විය. ඒ අනුව එක් සිසුවෙකු වෙනුවෙන් වූ පුහුණු පිරිවැය රු. මිලියනය ඉක්මවා වී තිබුණි. | ආයතනය පිහිටුවීම තුලින් අපේක්ෂා කරන අරමුණ කරා ලඟාවිය හැකි පරිදි ඉංජිනේරු සහකාරවරුන් සහ තාක්ෂණ සහායකයින් බඳවා ගෙන පුහුණු කිරීම ප්‍රශස්ථ මට්ටමින් සිදුකිරීම සඳහා විගණය විසින් පෙන්වා දී ඇති පරිදි වරකට පුහුණු කලයුතු නිලධාරීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිර්ණායකයන් සකස් කර පාඨමාලාවක් ආරම්භ කිරීමට පෙර මාගේ අනුමැතිය ලබාදීමට කටයුතු කරමි. | ආයතනයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ යලි සමාලෝචනයට ලක්කර වෙන්කර ඇති සම්පත්වලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ සැලසෙන පරිදි කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2017 වර්ෂයේ සිට 2022 දක්වා දේශීය ආයතන සේවකයින් වෙනුවෙන් කෙටි කාලීන පුහුණු වැඩ සටහන් 218 ක් සංවිධානය කර තිබුණු අතර එම පුහුණු පාඨමාලා ගාස්තු අය කිරීම , වියදම් කිරීම සම්බන්ධව අවිධිමත්භාවයන් පැවතුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව එක් එක් පාඨමාලා සඳහා අයකරනු ලබන ගාස්තු තීරණය කිරීමට අදාළ නිර්ණායකයන් සමාලෝචනය කොට පාඨමාලා ගාස්තු අය කිරීම සිදු කල යුතුය. එක් එක් පාඨමාලා සඳහා වන වියදම් දැරීමෙදී නිර්ණායකයන් තීරණය කොට වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38වගන්තිය යටතේ පදිධති සමාලෝචනයේ දී විශේෂ වධානය යොමු කර නව අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කල යුතුය. |

**04.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-----------------------** | **-----------------------------** | **-------------** |
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 179 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය **125** ක් විය. ඒ අනුව **,** ජොෂ්ඨ මට්ටමේ තනතුරු 20 ක, තෘතීක මට්ටමේ තනතුරු 01 ක, ද්විතීක මට්ටමේ තනතුරු 22 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 11 ක පුරප්පාඩු 54 ක් විය. | පිළිතුර ඉදිරිපත් කර නැත. | තනතුර අවශ්‍යතා සමාලෝචනයට ලක් කර අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කල යුතුය**.** |